# 8. මෆාහිමුල් ඉස්ලාමියා

## 8.1 ලෞකික ජීවිතය

මිනිසා ඔහුගේ ලෞකික මෙන්ම ආධ්‍යාත්මික ජීවිතය උදෙසා මධ්‍යස්ථ වූ ප්‍රතිපත්තියක් සකසා ගත යුතු යැයි ඉස්ලාම් ධර්මය අපේක්ෂා කරයි. එය එසේ වුවද මිනිසා වෙත එල්ලවෙන නොයෙකුත් බලපෑම් නිසා සමහරෙක් තම කටයුතු සියල්ල ලෞකිකව ද තව සමහරක් තම කටයුතු සියල්ල අධ්‍යාත්මික පැත්තට නැඹුරු කළද, ඉන් මිදී කටයුතු කරන්නටද ඔහුට සිදුවන බැව් පැවසිය හැකිය. එයට හේතුව වන්නේ ඔහු හා ඔහු වටා සිටින සමාජයයි.

පොදුවේ ලෞකික ජීවිතය සම්බන්ධයෙන් මිනිසා දරන අදහස් හා දෘෂ්ඨිකෝණය කුමක්ද? ඔහුගේ සෑම ක්‍රියාකාරකමක් පවතින්නේ ඒ අනුවය. ලෞකික ප්‍රශ්න හා දුක් කම්කටොළු වලින් මිදෙන්නට මිනිසා සිය ආශාවන් දුරලා එම ජීවිතය පිටුදැකිය යුතු යැයි සිතන්නෝද වෙති. මෙලෝ ජීවිතය අපට ලැබුණු එකම අවස්ථාවයි. එම ජීවිතය හැකිතාක් දුරට භුක්ති විඳිමින්, සතුටු සාමිචියෙන් ගෙවිය යුතු යැයි සිතන්නෝද වෙති. ඉස්ලාම් දහම ඉහත කී අදහස් දෙකටම ප්‍රතිවිරෝධී අදහසක් දරයි.

ඉස්ලාම් ලෞකික ජීවිතය කොටස් කළේ නැත. පරලොව සාර්ථක කර ගැනීමට වෙහෙස දරන අතර මෙලෝ දිවියෙහි සාර්ථකත්වය සඳහාද වෙහෙස විය යුතු යැයි තරයේ කියා සිටියි. “ඉමාරත්” නම් මෙපොළොව සශ්‍රීක කරන මෙහෙවරත් ඉබාදතයකි.

ලෞකික සැප සම්පත් හා ආම්පන්න ප්‍රයෝජනයට ගනිමින් මෙලෝ ජීවිතයද සාර්ථක කරගන්නා මෙන් අල්ලාහ් ඉල්ලා සිටියි. මෙලොවෙහි පැවැත්ම උදෙසා මිනිසා තමාටත් සමාජයටත් කරන මෙහෙවර හා ඵලදායි කටයුතු සියල්ලක්ම ඉබාදත් වශයෙන් සලකුණු ලබයි.

“මුස්ලිම්වරයෙකු පැලයක් සිටුවා එයින් ගසක් පැලවී එහි ඵලයන් මිනිසෙකු, සතෙකු හෝ පක්ෂියෙකු අනුභව කරන්නේද එය ඔහුට ආනිසංස ගෙන දෙන්නෙකි” (බුහාරී-මුස්ලිම්)

“අපගේ දෙවියනි, අපට (අවශ්‍ය දේ) මෙලොවෙහි දීම පිරිනමන්න, යනුවෙන් ඉල්ලන උදවියත් මිනිසුන් අතර සිටිති. නමුත් මෙවැන්නන්ට කිසිදු භාග්‍යයක් නැත. ඉතින්, යමෙකු “අනේ දෙවියනේ, අපට මෙලොවෙහිද යහපත සලසන්න, පරලොවෙහිද යහපත සලසන්න. අපායෙහි ගින්නෙන් අප මුදවා ගනු මැනව,” යනුවෙන් ඉල්ලන්නෝ ද මොවුන් අතර වෙති. තම ක්‍රියාවල භාග්‍යය ඔවුන්ට තිබේ. හැරත් අල්ලාහ් ගණන් පියවීමෙහි ලා අතිශයින් දැඩි වෙයි” (අල්කුර්ආන් 2: 200: 202)

“යම් මිනිසකු විසින් පොළොවේ (සාරවත් නැති) කොටසක් සශ්‍රීක කරනු ලබන්නේ ද එය ඔහුට අයිති වන්නේය.”

“අපරාධයක් කිරීමේ හෝ ආක්‍රමණය කිරීමේ චේතනාවෙන් තොරව යම් කෙනෙකු ගොඩනැගිල්ලක් සාදන්නෙහිද නැතිනම් පැලයක් සිටුවන්නේද එමඟින් රහ්මාන් (අසීමිත කරුණාවන්තයා) ගේ මැවීම් එල ලබාගන්නා කාලයක් තෙක් ඔහුට ආනිසංස ලැබෙමින් පවතී.” (අල්-හදීස්)

ඉස්ලාම්, සියලු දෑ එක්කොට ඇති ජීවන රටාවකි, හුදෙක් ආගමක් පමණක්ම නොවෙයි. තනි පුද්ගලයා සිට සමාජයේ සාමූහික ජීවිතය දක්වා අවශ්‍ය සියලුම අගයන්ගෙන් පිරිපුන් එකකි. ඉස්ලාම් කුසල් අගයන අතර මිනිසාගේ හිමිකම් උල්ලංඝනය නොවීමටත්, උල්ලංඝනය කිරීමෙන් වැලකීමටත් මෙලොවෙහි අවශ්‍ය අවවාදයන් ලබා දී ඇත.

ඉස්ලාම් සියලු කටයුතුවල මධ්‍යස්ථභාවය අපේක්ෂා කරයි. මෙලොවෙහි කටයුතුවල මිනිසා කඩිසරව හැසිරිය යුතු බවටත් ප්‍රකාශ කර සිටියි. නිදසුනක් වශයෙන් අපටම ආහාර සපයා ගැනීම, අපගේ පවුලේ අයට ආහාර සපයාදීම, ඔවුන්ට කරුණාවෙන් සැලකීම, අධ්‍යාපන ලබාදීම යනාදිය සඳහන් කල හැකිය. මේ සියලු කටයුතු ඉස්ලාමිය දෘෂ්ඨිකෝණයේ අනුමත ආනිසංස ගෙන දෙන කටයුතු වේ.

"අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා නුඹලා කරන වියදම්, ඔබගේ භාර්යාවගේ කටේ තබන එක් ආහාර කටක්, ඔබට ආනිසංස ගෙන දෙන්නකි." (බුහාරි)

අප පවුල රැක බලා ගැනීම සාමන්‍ය කාර්යයක් වුවද අල්ලාහ් එය ඉතා උසස් කොට සලකන්නේය.

ලෞකික ජිවිතය හා එහි සැප මුළුමනින්ම දුරලා නැමදුම් වතාවත්වල පමණක් නියලෙමින් තම පිවිතය ගත කළ සමහර සහාබාවරුන් නබි (සල්) තුමාණන් මගින් අවවාද කොට ඔවුන්ව මෙලොවෙහි කටයුතු වලටත් නිරත වන ලෙස ඉල්ලා සිටියහ.

නබි (සල්) තුමාණන් බැහැදැක, එතුමන්ගේ වතාවත් ගැන දැන ගැනීමට එතුමන්ගේ නිවසට සහාබිවරුන් තිදෙනෙකු පැමිණියහ. ඔවුන්ව නබි (සල්) තුමාණන්ගේ වතාවත් ගැන දැනුවත් කිරීමෙන් අනතුරුව, ඔවුන්ගෙ 'වතාවත් ඉතාමත් අල්ප බව වටහා ගත් සහාබිවරයෙක් මෙසේ කිවේය. "මා මින්පසු රාත්‍රිය පුරා නැමදුමෙහි සිටීමට අදහස් කරමි. "එවිට දෙවනි" මා උපවාස රකින්නට බලාපොරොත්තු වෙමි." "මා විවාහ නොවී සිටින්නට අදහස් කරමි." යැයි තෙවැන්නාද පැවසුවේය. මෙය අසා ඔවුන් හමුවට පැමිණි රසුල් (සල්) තුමාණන්, "ඔබ අතරින් අල්ලාහ්ට වඩාත්ම බිය වෙමින් පිවත් වන මා රැයේ නිදාගන්නෙමි. නැමදුම් ද ඉටු කරමි. සව්ම් සමාදන් ද වෙමි. සව්ම් සමාදම් නොවිඳ ඉන්නෙමි. යුග දිවියෙහි ද යෙදී සිටින්නෙමි. කව්රුන් හෝ මාගේ ආදර්ශයන් පිළිනොපදින්නේ ද ඔහු මගේ අනුගාමිකයෙකු නොවන්නේය." යැයි දේශනා කෙරුහ.

දෙවියන්ගේ ආදරයට පාත්‍රවීම සඳහා තමාටම වදහිංසා පමුණුවාගෙන වතාවත්වල යෙදීම ඉස්ලාම් අනුමත නොකරයි. ලෞකික ලෝකයට පිටුපා යෑම නබි (සල්) තුමාණන් හෙලා දැක ඇත.

නබි (සල්) තුමාණන් ලෝකය පිටුදැක ක්‍රියා නොකළහ. මෙලොවෙහි තමන් සතු වගකිම් ඉවතලමින් පිවත් නොවූහ. "දෙවියන්ගේ ආශිර්වාදය ලැබීමට මිනිස් වාසයෙන් තොරවූ වනාන්තරවලට හා කඳු හෙල් වල තනිව පිවත්විය යුතු" යැයි ඔවුන් දේශනා නොකළහ. මෙවන් තපස් පිවිතයක් ඉස්ලාමෙහි නැති බව එතුමන් දේශනා කළහ.

"තපස් පිවිතය අපට හිමි දෙයක් නොවන්නේය." (අල් - හදීස්)

"මෙම සෙහොනට අයිතිවාසිකම් කියන තැනැත්තාගේ මා මෙම සටහන අසා වැඩි කල් ගියේ නැත. එනම් යම් කෙනෙකු තම සහෝදරයෙකුගේ අවශ්‍යතාවයක් ඉටුකිරීම සඳහා පිටත් වී උත්සහයේ යෙදෙන්නේද ඔහු වසර දහයක කාලයක් දේවස්ථානයෙහි රැඳී සිටීමට වඩා එය බෙහෙවින් ආනිසංස ගෙන දෙන්නකි යන" හදීසය ඉබුනු අබ්බාස් (රලි) තුමන් දේශනා කළේය.

"මෙලොවෙහි ඔබගේ වගකිම් කොටස පැහැර නොහරින්න." (28 : 77)

"සියලු දෙනාම වගකිවයුත්තන් වේ ඔවුනොවුන්ගේ වගකිම් ගැන ප්‍රශ්න කරනු ලබන්නේය." (අල් - හදීස්)

මෙලොවෙහි අපට වගකිම් සමුහයක් ලබා දී ඇත. ඒවා පැහැර හැර පිවත් විය නොහැක. "රටක පාලකයා වගකිවයුත්තකු වන්නේය. ඔහුගේ වගකීම් ගැන ඔහුගෙන් ප්‍රශ්ණ කරණු ලබන්නේය."

“ස්වාමිපුරුෂයා තම පවුලේ වගකිවයුත්තා වේ. ඔහුගෙන් ඒ ගැන ප්‍රශ්න කරණු ලබයි. ස්ත්‍රිය තම ස්වාමි පුරුෂයාට වගකිවයුත්තා වන්නිය. ඇයගෙන් ඒ ගැන ප්‍රශ්න කරුණු ලබයි. ඔබලාගෙන් එක් එක් අයෙකුම වගකිවයුත්තන් වන්නේය. ඒ ගැන ඔබ සැම දෙනෙක්ම ප්‍රශ්න කරුණු ලබන්නේය.”

(බුහාරි-මුස්ලිම්)

ප්‍රජා සේවය ඉස්ලාමීය වගකිම්වලින් ප්‍රධාන අංගයකි. හුකුකුල් ඉබාදත් තත්ත්වයෙහි ලා සලකණු ලබන සියලු කටයුතු මෙලොවෙහි වගකිම් වන්නේය.

කිසියම් මාර්ගයක වැටි තිබෙන කටු අත්තක් ඉවත් කිරීම, සහෝදරයන් දෙදෙනෙකු අතර සමගිය ඇති කිරීම වැනි දෑ ඉතාම අගනා ඉබාදත්ය.

“මරණයට පසු අගනා ජිවිතයක් ඇත. එය ස්ථිරය. එහි යහපත ලැබීමට මෙලොවෙහි යහපත්ව හැසිරෙන්න.”

“එලෙසම මධ්‍යස්ථ වු ජනසමාජයක් ලෙස අපි ඔබව මැව්වෙමු. එම නිසා ඔබ අන් මිනිසුන්ට සාක්ෂිකයන්වන්න, එවිට අපගේ දුතයා ඔබට සාක්ෂි දරන්නේය.” (2 : 143) (අල්-කුර්ආන්)

“ලෞකික ජිවිතය අර්ථ විරහිත, අගයක් නැති, මුළාවක් පමණි” යන අරුත් දෙන කුර්ආන් වාක්‍යයද නැතුවාම නොවේ. පරලොවෙහි ජිවිතය ගැන සසඳා බලන කල මෙලොවෙහි ජිවිතය මුලාවක් පමණය. කුර්ආන් වාක්‍යයන් නිසි ලෙස වටහා ගැනීමෙන් මෙලොවෙහි හා පරලොවෙහි ජිවිත අතර සමබරතාවයෙන් ක්‍රියා කිරීමට හැකි වන්නේය.

“මෙලොව පරලොවෙහි වගා භූමියයි.” මෙලොව පිටු දැක අප කෙසේද පරලොවෙහි සම්පත් ලැබ ගන්නේ, යැයි අප සිතා බැලිය යුතුය. එම නිසා මෙලොව හා පරලොව ජිවිතය ගැන මනා අවබෝධයකින් හා පැහැදිමකින් කටයුතු කිරීමට අපි අදිටන් කර ගනිමු.

අභ්‍යාසය

පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) යන්නද, වැරදි නම් (×) යන්නද වරහන් තුළ ලකුණු කරන්න.

1. ඉස්ලාම් තපස් ජිවිතය අනුමත කරයි. ( )
2. මිනිසාගේ ලෝකය සම්බන්ධ වගකිම් ගැන ඔහු පරලොවෙහි ප්‍රශ්න කිරීමකට ලක් කරණු ලබන්නේය. ( )
3. ලෝකයෙහි කටයුතු ගැන මුස්ලිම්වරයෙකු නොසලකා සිටිය හැකියි. ( )
4. සමාජයේ පවතින සාපරාධී ක්‍රියාවන් පාලනය කිරීමට වෙහෙසීම මුස්ලිම්වරයෙකු සතු වගකීමකි. ( )
5. මෙලොව පරලොව යහපත සඳහා යොදගන්නා තැනැත්තා බුද්ධිමතෙකි. ( )
6. ඉස්ලාම් සියලු දෑ මධ්‍යස්ථව බලයි. ( )
7. ඉස්ලාම් මෙලොව ජිවිතයට පමණක් ප්‍රමුඛත්වය දී කතා කරයි. ( )
8. තමාගේ සහෝදරයන්ට ඉටුවිය යුතු යුතුකම් ගැන ඉස්ලාම් කිසිවක් කතා නොකරයි. ( )

පැවරුම්

1. ලෝකය මිනිසාගේ පමණක් නොව නොයෙක් ජිවීන්ගේ ව්‍යවස්ථානයයි. සතුන් කෙරෙහි මිනිසාගේ වගකීම් ගැන කියවෙන සිද්ධියක් ඉස්ලාමීය ඉතිහාසයෙන් උපුටා ලියන්න.
2. ලෝකය සශ්‍රික කිරීම සඳහා මිනිසා විසින් කුමක් කළ හැකි ද යන්න, විස්තර සහිතව පහදන්න.

# 8.2 විනෝදාංශ

ගුරුතුමිය : අස්සලාමු අලෛක්කුම් දරුවනි !
ශිෂ්‍යයන් : වලෛක්කුමුස්සලාම් ටීචර්
ගුරුතුමිය : ඔබලාගේ සුවදුක් කොහොමද?
ශිෂ්‍යයන් : ඔව්, ගුරුතුමී අපි සියලු දෙනා සතුටින් හා සැපසේ සිටින්නෙමු. අල්හම්දු ලිල්ලාහ්
ගුරුතුමිය : ඊයේ ඔබට මා ඉස්ලාම් ධර්මයේ විනෝදාංශ ගැන සඳහන් කරුණු ගොනු කර ගෙන පැමිණෙන්නට කීවා. එසේ ගොනු කරගෙන ආවාද?
ශිෂ්‍යයන් : අපි හැකි අයුරින් කරුණු සොයා ගොනු කර පැමිණියෙමු. ටීචර් !
ගුරුතුමිය : ඉතා හොඳයි. ළමයිනේ ! ඉන්ෂා අල්ලාහ්, දැන් අද විෂයට අපි පිවිසෙමු. මා ප්‍රයෝජනවත් වන පරිදි කාලය ගත කරන්නේ කෙලෙසද? යන්න කෙටියෙන් කියන්නම්. විවේකය අල්ලාහ් විසින් අපට ලබාදුන් වටිනාම දායාදයකි. එය අපට අල්ලාහ් විසින් දෙන ලද "අමානත්" හෙයින් භාරත්වයකි විවේකය වටිනාම වස්තුවක් ලෙස සැලකිය යුතුයි. අප කොච්චර වෙහෙස ගත්තත් ගෙවී ගිය විනාඩියක්වත් අපට නැවත ලබාගැනීමට නොහැකිය. අල්ලාහ් අපට ලබාදුන් විවේකය, ඔහු සෑහීමට පත්වන අයුරින් කළමණාකරණය කිරීම වැදගත්වේ. අල්ලාහ් හා ඔහුගේ නබි (සල්) තුමාණන් පෙන්වා දුන් ආකාරයට අප අපගේ එදිනෙදා කටයුතු සකසා ගත යුතුයි. එවිට අපට දවසේ විසිහතර පැයේම ඉබාදතයේ යෙදුනාමෙන් කුසල් රැස්කර ගත හැකිවේ.

කාලය සැළසුම් කරන්න. එය රන් හා සමානය. එය දෙවියන් අපට ලබාදුන් වටිනාම දායදයකි. මිනිසාගේ කය හා මනස නොයෙකුත් වැඩකටයුතුවල යෙදීමෙන් විඩාවට පත්වේ. එවිට සුළු වේලාවක් විවේකය ලැබීමෙන් නැවතත් ප්‍රබෝධය, සතුට, කාර්යක්ෂමතාවය ලබාගත හැකියි. එසේ නේද? දරුවනි !

ෆාතිමා : ටීචර්, අපේ තාත්තා විවේකය හා සම්බන්ධ හදීසයක් කියා දුන්නේය, මා එය කියවන්නම්,
"කරුණු දෙකක් ගැන මිනිසුන් නොසැලිකිලිමත්ව සිටිති. එම කරුණු දෙක නම් විවේකය හා නිරෝගී බවය." යනුවෙන් නබි (සල්) තුමා පවසා ඇත. (බුහාරි)
ගුරුතුමී : වඩාත් උචිත වූ හදීසයක් ෆාතිමා සඳහන් කළා, බොහොම හොඳයි.
ෆාතිමා : ටීචර්, මා ඉස්ලාමීය සඟරාවකින් උපුටා ගත් විස්තර සමහරක් ගොනු කර ගෙන ආවෙමි. එය කියවන්නම්.
නබි (සල්) තුමාගේ ජීවිතය මුජාහිද් (යුධ සෙබලකු) කෙනෙකුගේ ජීවිතයක් මෙන් සරලව හා කඩිසරකමව තිබුණි. එතුමන් තමන්ගේ කාය ශක්තිය පවත්වා ගැනීමේදි විශේෂ සැලකිල්ලක් දැක්විය. එතුමන් පිහිනුම් ක්‍රීඩාවට ඉතාමත් ප්‍රිය කළහ. මක්නිසාදයත්, එම ක්‍රීඩාව මගින් ශරීරයට අවශ්‍ය සම්පූර්ණ ව්‍යායාමය ලැබෙන නිසාය.

දවසක් නබි (සල්) තුමාණන් තම සහාබාවරුන් සමඟ තටාකයක පිහිනුම් ක්‍රීඩාවෙහි යෙදෙමින් සිටියහ. නබි (සල්) තුමා සහාබාවරුන් ජෝඩු වශයෙන් වෙන් කර එක් සහාබිවරයා අනෙක් සගයා වෙත පිහිණමින් යායුතු බව කියා සිටියහ. නබි (සල්) තුමාට තම ජෝඩුව වශයෙන් ලැබුනේ, අබුබක්කර් (රලි) තුමාය. නබි (සල්) තුමාණන් තම සගයා වෙත වේගයෙන් පිහිණුම් කර තම සගයාගේ කරින් අල්ලා ගත්තේය.

ගුරුතුමිය : වඩා හොඳ නිදසුනක් නේද? දරුවනි මෙම හදිසයෙන් රසූල් (සල්) තුමාණන් තමාගේ විවේක කාලයේ දී පිහිනුම් ක්‍රීඩාවෙහිද යෙදී ඇති බව අප වටහා ගත්තා නේද?

අහ්මද් : ටීචර් මා හොඳ හදිසයක් ලියාගෙන පැමිණ තිබෙනවා. එය කියවන්නම්.

"දුනු විදීම හා අශ්වාරෝහණයද ඉගෙන ගන්න. මා අශ්වාරෝහකයන්ට වඩා ප්‍රිය කරන්නේ දුනු විදීමේ ශූරයන්වය. එම ශිල්පය ඉගෙන ගත් කෙනෙකු එය අත්හරින්නේ නම් ඔහු දෙවියන්ගේ දායාදයන්ගෙන් එකකට අගෞරව කලාක් මෙනිය" යයි රසූල් (සල්) තුමාණන් පවසා ඇත්තේය.

ගුරුතුමිය : ඉතාමත් වැදගත් හදිසයක් අහමද් කිව්වා. මෙම හදිසයෙන් අප කිසියම් ආත්මාරක්‍ෂක හෝ සටන් කලාවක් ඉගෙන ගත යුතු යැයි මනාව පැහැදිලිවනවා.

හස්නා : ටීචර්, අපේ අක්කා මට රසවත් සිදුවීමක් කියා දුන්නා.

අබ්දුල්ලා ඉබුනු මුඅෆ්ෆල් (රලි) නම් සහබිවරයා තමාගේ ඥාති මිත්‍රයෙක් කුඩා ගල්වලින් යම්කිසි ක්‍රීඩාවක් කරමින් සිටීම දුටුවිට "මෙවැනි ක්‍රීඩාවල යෙදී කාලය නාස්ති කිරීම නබි (සල්) තුමාණන් තරයේ හෙළා දැක ඇත්තේය" යැයි පැවසුවේය. ඔවුන් එය නැවත නැවතත් කරනු දුටු එම සහබිවරයා, "අල්ලාහ්ගේ නාමයෙන් ඔබ සමඟ මා මින්පසු කතා නොකරමි" යයි පවසා එතැනින් නික්ම ගියේය.

ගුරුතුමිය : හස්නා කියා සිටි සිදුවීමෙන් අපි යෙදෙන සමහර විනෝදාංග මෙලොවට පමණක් නොව පරලොවට ද කිසිම ප්‍රයෝජනයක් ගෙන නොදෙන්නක් නිසා එම ක්‍රීඩාවල කාලය යෙදවීමෙන් වැලකී සිටිමු. දරුවනි!

අබ්දුල්ලා : ටීචර්, මා ඉස්ලාමීය සඟරාවකින් උපුටාගත් සමහර සටහන් කියන්නම්.

තමා ජිවත්වන පරිසරය අලංකාරව තබා ගැනීම ප්‍රයෝජනවත් විනෝදාංශයකි. තුරුලතාවන්ගෙන් තමා ජිවත්වන පරිසරය අලංකාරවත්ව හා පිරිසිදුව තබා ගැනීම, කාන්තාවන් නම් මැහුම් ගෙතුම්වල නිරතවීම, ගෙදර වැඩ කටයුතුවලදී මවට උපකාර කිරීම, පියාට ගෙවතු වැඩවලදී සහයෝගය ලබා දීම, තම නිවසෙහි වැඩිහිටියන් සිටිනම් ඔවුන්ට උදව් උපකාර කිරීම රැකබලා ගැනීම, දිනපතා පුවත්පත් කියවීම යනාදි සියලු කටයුතු යනාදී ඉස්ලාම් ධර්මයට අනුය අතිශයින් ප්‍රයෝජනවත් විනෝදාංග වේ.

ගුරුතුමිය : ඉතා හොඳයි, වඩා ප්‍රයෝජනවත් වූ විනෝදාංග ලැයිස්තුවක්ම ඔහු ඉදිරිපත් කළා.

මුහම්මද් : ටීචර්, අප අපට විවේකය ලැබෙන විට අල්ලාහ් දික්ර් (මතක්) කිරීමත් කළ හැකියි නේද?

ගුරුතුමිය : "ඔව්" මුහම්මද්, අපව මවා පෝෂණය කරන අල්ලාහ්ව මතක් කිරීම ආනිසංස ලබා දෙන්නකි. දිකර් කිරීම අපගේ මතක ශක්තිය වර්ධනය කරයි. එපමණක් නොව සෙයිතාන්ගෙන් අපට ආරක්‍ෂාවද ලැබෙයි. අල්ලාහ් අපට ලබා දී ඇති දායාදයන්ට කළ ගුණ සැලකීමක් වශයෙන් අප අල්ලාහ් හට තුති කළ යුතුයි. එසේ තුති කිරීම අපේ යුතුකමක් දරුවනි!

"කිසියම් වර්ධනයක් නොමැතිව ගෙවී ගිය දවසක් ගැන මා කණගාටු වනවා සේ වෙන කිසිම දෙයකට මා කණගාටු නොවෙමි" යයි ඉබුනු මස්ඌද් (රලි) තුමා වරෙක පවසා සිටියේය.

සිෆරාස් : ගුරුතුමිය අපට කාලවේලා ලැබෙන විට විනෝද චාරිකා හා වන්දනා යෑමට හැකි දැයි විස්තර කරන්නකෝ.

ගුරුතුමිය : බොහොම හොඳයි. මහ පොළොවේ පැතිර ගොස් අල්ලාහ්ගේ දායාදයන් දැකබලා ගන්න. තවද ඔබ ජයග්‍රහණය පතා අල්ලාහ්ව වැඩි වැඩියෙන් මතක් කරන්න. (අල්-කුර්ආනය)

එනමුදු ඉස්ලාම් ආගමට පටහැනිව විනෝද චාරිකාවන්වල යෙදීමට අපට අවසර නැත. සමහරුන් විනෝද චාරිකාවල යෙදෙන අතරතුර මත්ද්‍රව්‍ය භාවිතා කරති. සූදු ක්‍රීඩාවෙහි යෙදෙති. කාන්තාවන්ට තරවටු කරති. අසභ්‍ය වචන හුවමාරු කර ගනිති. සිනමා ගීත ගායනා කරති. මෙසේ කිරීමට අපට අවසර නැත. එයින් මිදී චාරිකාවල යෙදීමට තහනමක් නැත.

දූදරුවනි! තවත් විශේෂතම විනෝදාංශයක් ඇත. එනම් ප්‍රයෝජනවත් ක්‍රීඩා, තරඟවල යෙදීමය. විශේෂයෙන් ධාවන තරග හා මල්ලව පොරය සඳහන් කළ හැකිය. නබි (සල්) තුමාණන් තම ආදරණීය බිරිඳ වූ ආයිෂා (රලි) තුමිය සමඟ දවසක් ධාවන තරගයක යෙදී එතුමියව පරාජය කර ඇති බව සඳහන් වේ. තවත් දිනක නමගිය මල්ලව පොර ශූරයෙකුවද නබි (සල්) තුමාණන් අතින් පරාජය කරනු ලැබුහ.

හොඳයි දරුවනි, අපි අද පාඩමෙන් මේ දක්වා ඉස්ලාමයේ විනෝදාංශ ගැන කරුණු රාශියක් දැන ගත්තෙමු.

ළමයින් : ඉන්ෂා අල්ලාහ් නැවතත් හෙට හමුවෙමු. අස්සලාම් අලෛක්කුම්.

ළමයින් : වඅලෛක්කුමු අස්සලාම්, ජසාකල්ලාහු හයිරන්.

<u>අභ්‍යාසය</u>

(1) පහත සඳහන් විනෝදංශ අතරින් ඉස්ලාමීය දෘෂ්ඨි කෝණයෙන් ප්‍රයෝජනවත් ඒවා ප්‍රයෝජනවත් නොමැති ඒවායින් වෙන්කර දක්වන්න.

(1) මිතුරන් සමඟ අයාලේ ඇවිදීම

(2) මත්ද්‍රව්‍ය භාවිතය

(3) රමසාන් කාලයේ රාත්‍රියෙහි ක්‍රීඩා කිරීම.

(4) ඉස්ලාමීය සඟරාවන් කියවීම.

(5) තම නිවස පිරිසිදු කිරීම.

(6) කඩමණ්ඩියේ රස්තියාදු ගැසීම.

(7) ශාරීරික ව්‍යායාමවල යෙදීම.

(8) පැලයක් සිටුවීම.

(2) ඊයේ දිනය, ඔබ විසින් ගෙවනු ලැබුවේ කෙසේද යනුවෙන් සටහනක් ලියන්න.

(3) මෙම පාඩම කියවීමෙන් පසු හෙට දවසේ ඔබේ කටයුතු ඔබ කෙසේ සැලසුම් කිරීමට බලාපොරොත්තු වන්නේ ද යනුවෙන් සටහනක් ලියන්න.

(4) "අපි අපගේ විවේක කාලය ඉස්ලාම් අනුමත කල අයුරින් සැලසුම් කර ගනිමු" යන මැයෙන් ශිෂ්‍ය සමිතියේ කථාවක් පවත්වන්න.

# 8.3 ඥානයේ මූලාශ්‍රය.

අප ජිවත්වන මහ පොළොව ඇතුළු විශ්වය අල්ලාහ් විසින් මවනු ලැබුවේ මිනිසා සඳහාම ය. ඉස්ලාම් ආගම තම යථාර්තයන් ස්වභාව ධර්මයාට ගැලපෙන පරිදි මිනිසාට හඳුන්වා දෙයි. මෙම විශාල වූ විශ්වය මවා එහි ඥානය විහිදුවන්ට සලස්වූ අල්ලාහ් එම ඥානය මිනිසාට ලබා ගැනීමට ඔහුට අවබෝධය අවශ්‍ය යැයි ද ප්‍රකාශ කර සිටියි.

අල් කුර්ආනයේ ප්‍රථමයෙන් පහළ වූ වාක්‍යය හා අනෙකුත් බොහෝ වාක්‍යයන් ඥානයෙහි වැදගත්කම හා වටිනාකම ගෙනහැර පානවා සේම මිනිසා එය ගත යුතු යැයි ද ප්‍රකාශ කර සිටියි. අල් කුර්ආනය පහළ වූ කාලසීමාව නූගත්කමේ හා අන්ධකාරයේ කාල සීමාව යැයි සඳහන් කළ හැකියි. එම කාලසීමාව එලෙස හඳුන්වනු ලැබුවේ එම වකවානුව තුල ඥානයෙහි හිඟයක් දක්නට ලැබීම නිසාය.

ඉස්ලාම් ධර්මය ශිල්පයට මෙන්ම පර්යේෂණයට හා බුද්ධියට ප්‍රමුඛත්වයක් දෙන්නේය. සියලු දෑ දැස් වසාගෙන පිළිපැදීමට ඉස්ලාම් ආගම අවසර දී නැතුවා පමණක් නොව එසේ කිරීමද හෙළා දකින්නේය.

ඔබ පර්යේෂණය නොකරන්නේද? එය තුළින් බුද්ධිය නොලබන්නේද? යනාදී නොයෙකුත් ප්‍රශ්න අසමින් මිනිසාව පර්යේෂණය කරන මෙන් ඉල්ලා සිටියි. යම්කිසි දෙයක් පර්යේෂණයට ලක් කර එහි සත්‍යතාවය වටහා ගන්නා ලෙස ඉස්ලාම් ආගම මිනිසාට අවබෝධ කර සිටියි. මේ නිසා ඉස්ලාම් ධර්මය බුද්ධිමතුන්ගේ ධර්මය යැයි ප්‍රකාශ කළ හැකි අතර අනෙකුත් ආගම්, ශිල්පයට හා ඥානයට නොදෙන වැදගත්කමක් ඉස්ලාමය ලබා දෙයි.

ඥානය යනු සර්ව බලධාරී දෙවියන් වහන්සේ හා මිනිසාව යා කරණ පාලමකි. ගැත්තාගේ ඥානය වර්ධනය වන විට ඔහු තම දෙවියන් වෙත ළඟාවීමද වැඩි වන්නේය. දෙවියන් වහන්සේ හා මිනිසා අතර මේ ආකාරයෙන් සම්බන්ධතාවයද වැඩි වන විට ඔහුගේ ආශිර්වාදය හා ආරක්ෂාව මිනිසාට ලැබෙයි.

ඥානය, ආරෝග්‍ය සම්පන්න ජන සමාජයක් බිහි කරයි. මෙම ශිල්ප ඥානයෙන් දියුණුව ලැබූ නොයෙකුත් පෙර සමාජයන් සියලු ක්ෂේත්‍රයන්ගෙන් දියුණුව ලබා යෝධ ශිෂ්ඨාචාරවයන් හා අධිරාජ්‍යයන් බිහි කිරීමට හේතු වූ බවද අපි ඉතිහාසයෙන් අසා ඇත්තෙමු.

## ඥානයේ වැදගත්කම

"අහසේ හා පෙළොවේ මැවීම්, දිවා රෑ දෙකෙහි වෙනස්වීම්, මෙහි මිනිසාට නොයෙකුත් සාධකයන් ඇත" (අල් කුර්ආනය)

"ඥානය සොයා ලබා ගැනීම ගැහැණු පිරිමි දෙපක්ෂයේම වගකීමකි." නබි (සල්) තුමාගේ හදිසයක් අනස් ඉබුනු මාලික් (රලි) මෙසේ උපුටා දැක්වුවේය.

"ඥානය ලබාදෙන්න. එය ලබා ගැනීම අල්ලාහ්ට කීකරුවීමකි. එය සොයා ගැනීම යහපත් ක්‍රියාවකි. එය මතක් කිරීම අල්ලාහ්ට තුති පිදීමකි. එය සොයා පිටත්වීම ශුද්ධ වූ යුද්ධයට සහභාගි වීමකි. එය ලබා දීම සදකාවකි" (අල්-හදීස්)

"තම දරුවන් කියවීමට හා ලිවීමට හුරු පුරුදු කිරීම දෙමව්පියන්ගේ වගකීමකි" (අල්-හදීස්)

"ඔවුන් මෙම කුර්ආනය පර්යේෂණයට ලක් නොකරන්නේද? නැතිනම් ඔවුන්ගේ හදවත්වලට අගුලු ලා තිබේද?" (47:24)

ඉහත සඳහන් අල් කුර්ආන් වාක්‍යයන් හා හදීස් අප සැලකිල්ලට ගත්විට ඉස්ලාමයේ පංච මහා යුතුකම් වගේම ඥානය සොයා ලබා ගැනීම ද වැදගත්ම යුතුකමකැයි වටහා ගත හැකියි. ඥානය මිනිසා නිසි ලෙස සකසා ගැනීමට ඉවහල්වන ශක්තියකි. මෙය වටහාගත් බුද්ධිමතුන් තමන්ගේ ජීවිත කාලය පුරාම ඥානය ලබා ගැනීම සඳහා කැප කළහ. උපතේ සිට මිය යනතෙක්ම මිනිසා ඥානය සොයා ගනිමින් සිටිය යුතුයි. එය ලබා ගැනීමට වයස් හෝ කාල සීමාවක් නොමැතිය.

යම් කෙනෙකු තමගේ පෞද්ගලික හා සමාජීය යුතුකම්, එම යුතුකම් ඉටුකළ යුතුකම් ඉටුකළ යුතු ආකාරයන්, වත්පිළිවෙත්, ගෘහ පාලනය, දරුවන් හදා වඩා ගැනීම ඇතුළු සියලු දේ නිසි ආකාරව ඉටු කිරීමට ඔහුට ඥානය තිබිය යුතුය.

එක්තරා යුගයක මුස්ලිම් ප්‍රජාව විශ්වයේ බුද්ධිමත්ම ජන කොටසක් සේ සලකනු ලැබූහ. දේශපාලනය, ඉතිහාසය, ආර්ථිකය, වෛද්‍ය විද්‍යාව, භූගෝලය, තාරකා විද්‍යාව යනාදී සියලු ක්ෂේත්‍රයන්හි නියමුවෝ මුස්ලිම්වරුන් වූහ. බටහිර වැසියන්ගේ සූක්ෂම ක්‍රියා නිසා මුස්ලිම්වරු මෙම තත්ත්වයෙන් ඈත් කරනු ලැබූහ. ඥානය, මෙලොව ඥානය හෝ පරලොව ඥානය යයි වෙන් කොට සලකනු ලැබූ නිසා අද අප සමාජය අධ්‍යාපනය අතින් පරිහානියට ලක් වී ඇත.

## ඥානය ලබා ගැනීම

"දැනුම සොයාගන්න එයට නිසි තැන ලබා දෙන්න. එය විහිළු තහළු සමඟ මිශ්‍ර නොකරන්න" අලි (රලි) තුමා පැවසුවේය.

"ඔබ හිමිදිරියේ නිවසේ සිට දැනුම ලබා ගැනීමට පිටත් වූ වේලාවේ සිට නැමදීමෙහි නිරතව සිටින්නේය. දැනුම ලබා ගන්නා කල් ඔබ සිටින්නේ නැමැදුමෙහිය" (ඉබ්නුමාජා)

" ඥානය මුස්ලිම්වරුන්ගෙන් ගිලිහී ගිය වස්තුවකි. එය සොයා ලබා ගැනීම සියලු දෙනාගේම යුතුකමකි"

" යම් කෙනෙකු අධ්‍යාපනය ලබා ගැනීම සඳහා මාර්ගයක් සකසා දෙන්නේ නම් ඔහුට ස්වර්ගයේ මාර්ගය අල්ලාහ් පහසු කරන්නේයි."

ඉහත සඳහන් අල්කුර්ආන් හා හදීස් වැකි වලින් ඥානය සොයා ලබා ගැනීම අපේ යුතුකමකැයි අපි තේරුම් ගතිමු. අප ජීවත්වන නවීන ලෝකයේ අධ්‍යාපනයේ දොරටු විවර වී ඇත. එම නිසා දැනුම ද ව්‍යාප්ත වී ඇත.

1 විද්වතුන්ගේ දේශනා මගින්,
2 සමාජයේ හා වටපිටාවේ නොයෙකුත් සිදුවීම් වලින්,
3 අල්කුර්ආන් පරිවර්තනයන් හා හදීස් ග්‍රන්ථයන් මගින්,
4 විද්වතුන් විසින් රචිත ග්‍රන්ථ, හදීස් ග්‍රන්ථ, රචනා හා සඟරා මගින්,
5 මාසික හා වාරිකව එළිදැක්වෙන පුවත්පත් හා නොයෙකුත් සඟරා,
6 ප්‍රයෝජනවත් වෙබ් මගින්,

යන නොයෙකුත් මාධ්‍ය වලින් නවීන ලෝකයේ ඥානය හා දැනුම ලබාගත හැකි වී ඇත.

## අපගේ යුතුකම්

ඉස්ලාම් ධර්මයේ සියලු කොටස්වල අන්තර්ගතය තේරුම් ගැනීමට ප්‍රමාණවත් දැනුමක් අප සතුව තිබෙන්නේ ද? යැයි අප විසින්ම අපව ස්වයං පරීක්ෂණයට ලක් කළ යුතුය. මිනිසා පරිපූර්ණ වන්නේද පරිපූර්ණ මුස්ලිම්වරයෙකු වන්නේද දැනුම ලබා ගැනීමෙන්ය.

1 විද්වතුන් හමුවී අප නොදන්නා දේ ගැන විමසා සිටිමුද,
2 ඉස්ලාම් පිළිබඳව පැන නැගෙන ගැටලුවලදී අප ශුද්ධ වූ කුර්ආනය පෙරළා බැලුවෙමුද?
3 අපට අල්ලාහ් ලබාදුන් දායාදයන් වන බුද්ධිය, හැකියාව, දෘෂ්ඨිය හරහා ඉස්ලාමය වටහා ගත්තේමුද?
4 අපගේ දැනුම් ස්වල්පය තවත් සහෝදරයෙකුට ප්‍රදානය කළෙමුද?
5 බුද්ධිමතුන් හා ආලිම්වරුන් සමඟ එක් වී සිටියෙමුද?

අප අපගේ පංච කාල නැමැදුම් වලදී අනිවාර්යයෙන්ම අපගේ බුද්ධිය වර්ධනය සඳහා අල්ලාහ්ගෙන් යාඥා කළ යුතුය.

" දැනුම (නොදන්නා දෙයක්) ගැන යම් කෙනෙකුගෙන් විමසනු ලැබූ ඔහු එය දැන සිට වසන් කරවුයේ නම් ඔහුට කියාමාවෙහි ගිණිදැල් වලින් යදම් පළඳවනු ලබයි"

## උගතුන් හා ආලිම්වරු

අල් කුර්ආනයේ හා සුන්නාව ඥානයෙහි හා දැනුමෙහි වැදගත්කම විදහාපෑමෙන් නොනැවති එය ලෝකයට ලබා දෙන උගතුන් හා ආලිම්වරුන්ගේ වැදගත්කම හා ඔවුන්ගේ අවශ්‍යතාවද මනාව පෙන්වා දී ඇති බව අල් කුර්ආනය උසුරීමෙන් වටහා ගත හැකිය.

නබිවරුන් පහළ නොවූ වකවානුවලදී එම අඩු පාඩුව අල්ලාහ් තආලා ආලිම්වරු ලවා පියවන්නට සැලැස්වූයේය. ආලිම්වරයෙකු අපට හිමි වූ විට මුස්ලිම් ප්‍රජාව ශෝක විය යුතු යැයිද ඔහු වෙනුවෙන් තව කෙනෙකු ලෝකයට ලබා දෙන ලෙස අල්ලාහ්ගෙන් ඇසිය යුතු යැයිද දිවා කාලයේ සව්මයේ යෙදී රාත්‍රියේ වතාවත්වල යෙදෙන දහසක් බැතිමතුන්ට වඩා එක ආලිම්වරයෙකුගේ මරණය ශෝක ජනක යැයිද එය මුස්ලිම් ප්‍රජාවට පාඩුවකි යැයිද ඉස්ලාම් පෙන්වාදේ. ඒ මක්නිසාද යත්, ආලිම්වරයෙකු හරාම් හලාල් ගැන මනා අවබෝධයෙන් සිටින්නෙකු නිසා යැයි උමර් (රලි) තුමා දේශනා කර ඇත.

බුද්ධිය හෝ දැනුම, හැදියාව හා එක්වූ විට එය අපට වඩ වඩාත් ප්‍රයෝජන ගෙන දේ. අප දැනුම ලබා ගන්නේ එමඟින් අපට හා අප සමාජයට ප්‍රයෝජනයක් හෝ යහපතක් සැලසීමටය. එසේම අල්ලාහ් අපට දායාද කල දැනුම ගැන අප උදම් වීම හ ආඩම්බර වීම නොකළ යුතුය, එසේ තමා ලැබූ දැනුමෙන් ආඩම්බරව හැසිරීම නොමඟ ගිය සමහර ආලිම්වරු ගැනද ඉස්ලාමීය ඉතිහාසය සඳහන් කරයි.

ඥානයේ අධිපති අල්ලාහ්ය, ඔහුගේ කැමැත්ත පරිදි සමහරුන්ට එය ලබාදෙන අතර තවත් සමහරුන්ට එය නොදී සිටින්නේය. මිනිසාට ලබාදෙනු ලැබුවේ ඥානයෙන් ඉතාම ස්වල්පයක් පමණක් ද එය වැඩිදුරටත් වර්ධනය කරදෙන ලෙස අල්ලාහ්ගෙන් අප ඉල්ලා ප්‍රාර්ථනා කළ යුතු යැයි ද අල්ලාහ්ම අපට පෙන්වා දෙන්නේය.

"මහා භාග්‍යවන්තයා හා සියලු දේවල් අභිභවනු ලැබුවාවූ ද ඔහුය"

"ඉතාමත්ම ස්වල්ප දැනුමක් විනා ඔබට (අධිකව) ලබාදෙනු නොලැබුවේය" (17,85)

"මාගේ දෙවියන් වහන්සේ මාගේ ශිල්ප ඥානය වර්ධනය කරත්වා" (20:114)

"ඔබ අතරින් විශ්වාසවන්තයන්ගේත් හා ශිල්ප ඥානය ලබා ඇත්තාවුන්ගෙත් තත්ත්වය අල්ලාහ් උසස් කරන්නේය" (58:11)

හුදෙක් ප්‍රාර්ථනා පමණක් නොකොට අප අපගේ ශිල්ප ඥානය වර්ධනය කර ගැනීම සඳහා උත්සහයෙහි යෙදිය යුතුයි.

1 නබි මූසා (අලෛ) තුමා සමහරක් නොදන්නා දෑ දැන ගැනීමට හිල්ර් (අලෛ) නම් වූ පඬිවරයා හමුවට ගොස් ඇත.

2 නබි සුලෛයිමාන් (අලෛ) තුමා "හුද් හුද්" නැමැති පක්ෂියාගෙන් සබා නම් දේශය ගැන තොරතුරු ලබාගත් බවද, අල් කුර්ආනය සඳහන් කරයි.

ආලිම්වරු හා උගතුන්, තමන්ට වඩා යම්කිසි පහත් තත්ත්වයකින් සිටින්නන් වුවද ඔවුන් වෙත අප ළඟාවී දැනුම ලබාගත යුතු යැයි ඉහත සඳහන් සිදුවීම් මගින් අපි අනාවරණය කර ගනිමු.

"සත්‍ය වශයෙන්ම, ආලිම්වරු නබිවරුන්ගේ පරපුර වේ. නබිවරුන් මෙලොවෙහි දිර්හමය හා දිනාරය තමන්ගේ වස්තු ලෙස ඉතිරිව තබා ගියේ නැත. ඔව්හු ඉතිරිව තබා ගියේ ඥානය යයි එය ලබාගන්නන් මෙලොවෙහි ඉතා භාග්‍යවන්තයන් වන්නෝය" (අබූ දාවූද්-තිර්මිදි)

"අල්ලාහ් යම් කෙනෙකු හට යහපත් කරන්නට සිතුවේ නම් ඔහුට ආගම පිළිබඳ අවබෝධය ලබා දෙන්නේය" (අල් හදීස්)

" ඥානය ලබා ඇති අයගේ තත්ත්වය පරලොවෙහි අල්ලාහ් කිසිවෙකුටත් සිතා ගත නොහැකි තරම් උසස් කොට තබන්නේය"

"භක්තිකයෙකු හා ආලිම්වරයෙකු අතර වෙනස අහසේ සඳු හා තරු අතර ඇති වෙනස බඳුය"

"මාගේ ආත්මය කව්රුත් සතුව තිබෙන්නේද? මම ඔහුගේ නාමයෙන් දිවුරා ප්‍රකාශ කරමි. ශුද්ධ වූ යුද්ධයට ගොස් ෂහිද් වූ අය පවා, ආලිම්වරයෙකුට අල්ලාහ් විසින් පිරිනමනු ලැබූ තත්ත්වය හා පිළිගැනීම් දෙස බලා තමාවද කියාමා දිනයේ නැගිට්ටුවීම ප්‍රිය කරයි." යැයි ඉබුනු මසූද් (රලි) තුමා හදීසයක් සඳහන් කරයි.

"ෂෛතාන් හට ආලිම්වරයෙකු පරාජය කිරීම දහසක් වූ ආබිද්යන් (භක්තිකයන්) පරාජය කිරීම හෝ හසු කර ගැනීමට වඩා අමාරු වූ කාර්යයක්" යැයි නබි (සල්) තුමා ප්‍රකාශ කර ඇත. (තිර්මිදි)

අල්ලාහ් හා ඔහුගේ දූතයන් ආලිම්වරුන් ගැන ප්‍රශංසා මුඛයෙන් කථා කොට ඇති අතර ඔවුන්ගේ තත්ත්වයෙන් උසස් කොටද සලකා ඇති බවද වටහා ගත හැකිය.

මෙම පොළොව සරුවෙන්නේ පඬිවරුන්ගෙන්ය. ඔවුන් කරන්නට පෙළඹෙන්නේ යහපත් දේමය, ඔවුන්ගේ සිතුවිලිද යහපත්ය. එපමණක් නොව, අපට හරාම්-හලාල් වෙන්කොට දෙන්නෝය. එමගින්ද අපව නිසි මගට යොමු කරති. කෙටියෙන් පවසනවා නම්, ඔවුන් අපව පරලොව ගින්නෙන් ආරක්‍ෂා කරති.

"මුහම්මද් (සල්) තුමාගේ උම්මතයේ ඔවුන්ගේ දෙමව්පියන්ට වඩා ආලිම්වරු හා උගතුන් ඉතාමත් ආදරයට පාත්‍ර වූවන් වෙති. එය මක්නිසාද යත්, දෙමව්පියන් තම දූ පුතුන් මෙලොවෙහි ගින්නෙන් ආරක්‍ෂා කරති. නමුදු ආලිම්වරු පරලොව ගින්නෙන් ඔවුන්ව ආරක්‍ෂා කරති" යැයි ඉබ්නු මඅස් නැමැති අය සඳහන් කර ඇත.

අපිද අපට හැකි අයුරින් පඬිවරුන් හා අපට ශිල්පය ලබාදෙන ගුරුවරුන් හා එක්ව සිට ඔවුන්ව ගරු කිරීමටද අදිටන් කර ගනිමු.

<u>කෙටි පිළිතුරු ලියන්න.</u>

(1) I. ඥානයෙහි වැදගත් කම කියාපාන අල්-කුර්ආන් වාක්‍ය දෙකක් හා හදීස් දෙකක් සඳහන් කරන්න.

II. අධ්‍යාපනය ලබාගන්නා විට ශිෂ්‍යයන්ට වූ ඔබ හැසිරිය යුතු ආකාරය ගොනු කරන්න.

(2) හිස් තැන් පුරවන්න.

I. ඉස්ලාම් ධර්මය අධ්‍යාපනයට පමණක් නොව ...................................... ප්‍රමුඛත්වයක් ලබා දෙයි.

II. අල් කුර්ආනයේ ප්‍රථමයෙන්ම පහළ වූ වාක්‍ය ................................................... වැදගත්කම ගෙන හැරපාන වාක්‍යයකි.

III. ................................................. නබි (අලෛ) තුමා මවා අල්ලාහ් ඔහුව සියලු දේ ගැන දැනුවත් කෙරුවේය.

IV. ............................................... ෂෛතාන්ගේ උගුලෙහි නොවැටෙති.

V. ............................................... නබි (සල්) තුමා සමහර දෑ දැන ගැනීමට හිල්ර් (අලෛ) නම් පඬිවරයා වෙත ගියේය.

VI. මුස්ලිම් ප්‍රජාව ................................................ ගේ මරණය ගැන කම්පා විය යුතුය.

VII. ඉස්ලාම් ධර්මය .............................................. ලබාදුන් වැදගත්කම සේ අන් කිසිම ආගමක් එයට ලබා දී නැත.

VIII. .......................................... තමන්ගේ පරපුර යයි නබිවරුන් ප්‍රකාශ කොට ඇත.

IX. බුද්ධිමතුන්ට අල්ලාහ් ................................................ නොයෙකුත් සාධකයන් පෙන්වා දී ඇත.

X. ............................................ තුමා නවීන ලෝකයේ ශ්‍රේෂ්ඨතම ඉස්ලාමීය විද්වතෙකු ලෙස හැඳින්විය හැකිය.

# 8.4 අල් කුර්ආනයේ විශ්මිතයන්

විශ්මිතයන් යන්නට අරාබි බසින් "මුඃජිසාත්" යනුවෙන් කියැවේ. මුඃජිසාත් යනු සාමාන්‍ය මිනිසෙකු විසින් කර පෙන්වන්නට නොහැකි වූ යම් විශ්මයජනක ක්‍රියාවන්ය. එක් එක් කාල වකවානුව තුල පහළ වූ නබිවරුන්ට එතුමන්ලාගේ නබිත්වය සනාථ කර, ඔප්පු කිරීම සඳහා අල්ලාහ් විසින් ඔවුන් හට ප්‍රදානය කරනු ලැබූ විශේෂ හැකියාවන් මුඃජිසාත් වේ. නබිවරුන් විනා අන් අයට විශ්මිතයන් ලබා නොදෙන ලදී.

විශ්මිතයන් ලබා දී තිබූ නබිවරුන්ගෙන් විශේෂයෙන් මූසා (අලෛ), ඊසා (අලෛ), දාවුද් (අලෛ), සුලෛමාන් (අලෛ), සාලිහ් (අලෛ) යන නබිවරුන් විශේෂයෙන් සඳහන් කළ හැකිය. නබි (සල්) තුමන්ද යම් යම් අවස්ථාවල ස්ථානෝචිත ලෙස විශ්මිතයන් පෙන්වා ඇත්තාහ.

නබි (සල්) තුමාණන්ට අල්ලාහ් විසින් ප්‍රදානය කරන ලැබූ සදාකාලීන විශ්මිතය ලෙස "අල්-කුර්ආනය" සඳහන් කළ හැකිය. නබි (සල්) තුමාණන් ලෝකයේ ජිවත්ව සිටින විටදී මෙන්ම එතුමන් ජිවත්ව නොසිටින කාළ වකවානුව තුලදීද අල් කුර්ආනය තම විශ්මිතයන් ලෝකයට ලබා දෙමින් සිටියි. මිනිසා බුද්ධියේ ඉහලම ස්ථානයේ වැජඹුනද අල් කුර්ආනයට අභියෝගයක් එල්ල කිරීමට පඬිවරයෙකුට හැකිවී නැත.

අල් කුර්ආනයේ
- * භාෂා විලාශය විශ්මිතයකි.
- * ගැඹුරු වූ අර්ථවත්භාවය විශ්මිතයකි.
- * අනාවැකි පළකිරීම් අතින් විශ්මිතයකි.
- * ඉතිහාස සටහන් ගෙන හැරදැක්වීම විශ්මිතයකි.
- * ගැටළු නිරාකරණය කිරීමෙහිලා විශ්මිතයකි.
- * වසන් දෑ ඉදිරිපත් කිරීමේ විලාශය විශ්මිතයකි.

## අල් කුර්ආනයේ භාෂා විලාශය

"ඔවුන් බැති බියෙන් සිටිම සඳහා කිසිදු අඩුපාඩුවකින් තොරවූ අරාබි බසින් අපි පහළ කෙළෙමු"

(අස්සුමර් :28)

"අල් කුර්ආනය පහළ කළ විලාශය වශිකරය, හදවත සසල කරවන සුළුය, අල් කුර්ආනය පහළ කරනු ලැබුවේ අරාබිකරය කවින්ගේ ආධිපත්‍යයට යටත්වූ කාලසීමාවකය. කවීන්ට සමාජයේ ඉහළම ස්ථානය ලබා දී තිබුණි. කවින් ඉතා වැදගත් අය ලෙස සලකනු ලැබුවෝය. වලිද් ලුබෛද් යන සුප්‍රසිද්ධ කවීන් පවා තම නොහැකියාව කුර්ආනය ඉදිරියේ පිළිගෙන ඇත. අල් කුර්ආනයේ වාක්‍යයන්ට සමානව එක් වාක්‍යයක්වත් මෙවන් කවියන්ට රචනා කිරීමට නොහැකි විය. එවන් භාෂා විලාශයක් අල් කුර්ආනය සතු විය.

## ගැඹුරු වූ අර්ථවත්භාවය

අල් කුර්ආනය ලොවෙහි අන් කිසිම ග්‍රන්ථයක දක්නට නැති තරම් දේශනා හා මිනිසාට අවශ්‍ය ප්‍රතිපත්ති ඉතා ගැඹුරු ලෙස අර්ථවත්ව විදහා දක්වා ඇත. මිනිස් ජිවිත හැඩගැස්වීම සඳහා අවශ්‍ය පදනම්, ඉතාමත් ප්‍රියජනක විලසින් ගෙන දැක්වීම අතින් විශ්මිතයකි. නිදසුනක් වශයෙන් දේශපාලන, ආර්ථික, නිතිරීති, ප්‍රජාව හා සම්බන්ධ කටයුතු හා තව බොහෝ විෂය ධාරාවන්ගෙන් අල් කුර්ආනය පිරී ඇත.

## අනාවැකි පළ කිරීම්

අල් කුර්ආනය අනාවැකි පළකිරීම් අතින් විශ්මිතයක් උසුලයි. නිදසුනක් වශයෙන් නබි (සල්) තුමන්ගේ ජීවිත කාලයේදී රෝම, පර්සියානු අධිරාජ්‍යයන් ඉස්ලාමී රාජ්‍යය යටතට අනාගතයේ දී පැමිණෙතැයි අනාවැකි පල කර සිටියේය. පසු කාලයේ දී එය එසේ සිදුවිය.

## ඉතිහාස සිදුවීම් ගෙනහැර දැක්වීම

ඉස්ලාමයට පෙර සිදුවූ සමහර ඉතිහාසගත, විශේෂිත වූ සිදුවීම් අල් කුර්ආනය මනාව පැහැදිළි කරයි. නිදසුනක් වශයෙන් "ආල-ඉම්රාන්" නැමැති සූරාව හා "යූසුෆ්" නැමැති සූරාව පෙර පහළ වූ නබිවරුන්ගේ ඉතිහාසය ගැන සඳහන් කරයි. ඉතිහාස සිදුවීම් මගින් අපට බොහෝ පාඩම් ඉගෙන ගත හැකි සිදුවීම් ද ගෙනහැරපායි. "ෆීල්" නැමැති සූරාවෙහි කඃබාව විනාශ කිරීමට පැමිණි "අබ්රහා" නැමැත්තාගේ ඇත් හමුදාව ගැන විස්තර කරණු ලබයි. සූරා "කහ්ෆ්" හි සුප්‍රසිද්ධ ගල් ලෙන් වැසියන් ගැනද ගෙන හැර දක්වයි.

## ගැටළු නිරාකරණය කිරීම

නබි (සල්) තුමාණන්ගේ ජීවිත කාලයේ දී පැන නැගුණු යම් යම් ගැටළුවලට පිළිතුරු සැපයූ විලාශයෙන්ද, සහාබාවරුන් විසින් ගෙන එනු ලැබූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ විලාශයෙන්ද ආයිෂා (රලි) තුමියට එල්ල වූ අසත්‍ය චෝදනාවලට ද නිසි පිළිතුරු අල් කුර්ආනය මගින් සැපයීමේ විලාශයෙන් ද කුර්ආනය විශ්මිතභාවයක් උසුලයි. ප්‍රධානතම ඉස්ලාමීය නීති මූලාශ්‍රය වන්නේද අල් කුර්ආනය යි.

## සැඟවුණු දෑ ගෙනහැර පාන විලාශය

මිනිසාගේ දෑස්වලට නොපෙනෙන නොයෙක් දෑ පිළිබඳ අල් කුර්ආනය ප්‍රකාශ කර සිටියි. විශ්වය, අහස් තලයන්, පොළොවෙහි මැවීම්, සුළඟ, ජලය, ගින්න, කඳු හෙල් හා විද්‍යාත්මක තොරතුරු ගැන නොයෙකුත් පැතිකඩ වලින් අල් කුර්ආනය සැඟවුණු විශ්මිතයන් ඉදිරිපත් කරයි.

ඉහත දැක්වූ දෑ පමණක් නොව අල්කුර්ආනයේ ආරක්ෂාවද විශ්මිතයකි. අල්කුර්ආනය පහළ වූ වකවානුවේ සිට මේ දක්වා අංශු මාත්‍රයක තරමක් වත් වෙනස්කම්වලට භාජනය නොවිය. එසේ වෙනස්කම් කිරීමටද නොහැකි අල්කුර්ආනය ආරක්ෂා කරන ලද ග්‍රන්ථයකි. එය ආරක්ෂා කරනු ලබන්නේ අල්කුර්ආනය ලොවට ලබා දුන් අල්ලාහමය. ඔහු අල්කුර්ආනයේ සදාකාලික ආරක්ෂකයාය. ලොවෙහි වැඩිම පිරිසක් කට පාඩමට ලක් කොට ඇති ග්‍රන්ථය වශයෙන්ද අල්කුර්ආනය විශ්මිත භාවයක් උසුලයි.

<u>අභ්‍යාස</u>

1. අල් කුර්ආනයේ ඉතිහාස සිදුවීම් ගැන සඳහන් කරණු ලැබූ සූරාවන් පහක නම් සඳහන් කරන්න.
2. විශ්මිතයන් ප්‍රධානය කරණු ලැබූ නබිවරුන් පස් දෙනෙකුගේ නම් හා ඔවුන්හට ප්‍රධානය කරණු ලැබූ විශ්මිතයන් ද සඳහන් කරන්න.
3. නබි (සල්) තුමාණන් මවා පෙන්වූ විශ්මිතයන් ලියා දක්වන්න.
4. මුජිසාත්-කරාමත් යන පදයන් වෙන්කර පැහැදිලි කරන්න.
5. නබිවරුන්ට විශ්මිතයන් ලබාදීමට හේතු කවරේදැයි සඳහන් කරන්න.

## 8.5 මානසික සුවය

මුස්ලිම්වරයෙකු සැමවිටම මානසික සුවයෙන් සිටීම අනිවාර්ය වේ. එලෙස සිටිනම් ඔහුගේ කයද සුවයක් ලබයි. ඔහුගේ කටයුතු ද නිසි පරිදි සිදුවේ. මිනිසකුගේ මානසික සුවය ඔහුගේ කායික සුවයෙහිද බලපෑම් ඇති කරන්නට සමත්ය. රුධිර පීඩනය, හිසරදය, නින්ද නොයෑම, ආතතිය ආදි රෝග තත්ත්වයන්, මානසිකත්වය හා සම්බන්ධතාවයක් දරයි. මිනිසාට උපතින්ම පිහිටා තිබෙන රෝග ප්‍රතිශක්තිකරණයට, භිතිය, දුක, සංකාව වැනි දෑ වලින් බලපෑමට ලක්වන්නේය.

යම් කෙනෙකුගේ සිතෙහි අසීමිත ආශාවන් ඇතිවේ නම් එම තත්ත්වය "හවා" යැයි ඉස්ලාම් ප්‍රකාශ කරයි. එවැනි තණ්හාවක් හෝ අධික ආශාවක් ඇතිවී ඉෂ්ඨ නොවී යන්නේ නම් ඔහු අධෛර්යමත් වීමට හැකියි. මෙම තත්ත්වය දීර්ඝ වූ විට නොයෙකුත් මානසික ආබාධයන් හා කළකිරීමට ලක්වීමට සිදුවේ. මෙවන් ලෙඩදුක් ආබාධ වලින් වැලකී සිටීමට අපගේ මානසිකත්වය සුවසේ තිබිය යුතුය.

### මානසික ආබාධවලට හේතු

#### ලෝකය පිළිබඳ අසීමිත ඇල්ම

මේ ලෝකය පිළිබඳ ඇල්ම මුස්ලිම්වරයෙකුට නොතිබිය යුතුය. එම ඇල්ම ඔහුව මේ ලෝකයේ හැල්ලුවට ලක් කරවයි. එපමණක් නොව පරමාන්තයේදී ද නිරයට තල්ලු කර දමයි.

"සියලු විනාශයන්ට මුල, ලෝකය පිළිබඳ වූ අධික ඇල්මය" (හදීස්)

### පව් අධිකවීම

පව් කිරීම පමණක් නොවෙයි එයට අනුබල දීම, අනුමත කිරීම යනාදි සියලු දෑ යම් කෙනෙකුගේ මානසිකත්වයට බාධා පමුණුවයි. නබි (සල්) තුමාණන් පව් හා සම්බන්ධ සියලු දේ අප්‍රිය කළහ.

"සිරුරෙහි එක් මස් පිඩුවක් ඇත. එය යහපත් වේ නම් මුළු සිරුරම යහපත් වේ. එය නරක් වී යයි නම් මුළු ශරීරයම නරක් වී යයි."

### අසීමිත අශාවන්

"යම් මිනිසෙකුට එක් මිටියාවතක් පුරා රත්තරං පුරවා ලැබුණද ඔහු එවැනි තවත් මිටියාවත් දෙකක් පුරවා රත්තරං තිබෙනු දැකිමට ආශා කරයි. අවසානයේ දී ඔහුගේ මුව පුරවනු ලබන්නේ පස් වලිනි. තමාගේ පවවලට සමාව අයදිමින් මෙම තත්ත්වයෙන් මිදී සිටින්නන්ට අල්ලාහ් සමාව ලබාදෙයි."

(බුහාරි-මුස්ලිම්)

"යම් දෙයක් ඔබට ඉතාමත් ප්‍රයෝජනවත් වුවද එයට ඔබ අකැමැති විය හැකිය. යම් දෙයක් ඔබට අයහපතක් ගෙන දෙන්නක් වුවද ඔබ එයට ප්‍රිය කළ හැකියි. කුමක් ඔබට යහපතක් හෝ අයහපතක් ගෙනදේද යන්න අල්ලාහ් හැර ඔබ නොදන්නේය."

(2 : 216)

මිනිසාගේ අසීමිත අශාවන් හා තණ්හාව ඉදිරියේ භාණ්ඩ සඳහා තරඟයක් ඇතිවී ඊර්ෂ්‍යාවද වර්ධනය වී එය භායානක අරගල දක්වා වර්ධනය විය හැකිය.

## හැඟීම්වලට වහල්වීම

ලොවෙහි ඉතාම අමාරු කාර්යය හැඟීම් සමඟ සටන් කිරීමය. අකුසල්වලට අප ලංකරන්නේ හැඟීම්ය. කුසල් කිරීමට තැත් කරන විට කම්මැලි ස්වභාවයක් හා අප්‍රිය ගතියක් ඇතිවේ. හැඟීම් අපට ඉස්ලාමීය මාර්ගයෙන් ඉවතට විසි කර දමයි. එවිට අල්ලාහ් සමඟ ඇති බැඳීමද දෙදෙරා යයි. හිතට වහල්වීම නිරයට මාර්ගය සකසා ගැනීමකි.
"එක් ගැත්තකුගේ හදවත නිසියාකාරව නොතිබෙන්නේ නම් ඔහුගේ ඊමානය පරිපූර්ණ නොවේ"
(මුස්නද් අහමද්)
"තම සිත සමඟ සටන් කිරීම සත්‍ය ජිහාද් වේ." යැයි නබි (සල්) තුමා පැවසුහ.

### සිත ආරෝග්‍යමත් වන ආකාරය

අපේ හදවත්වල කොතරම් කුණු කසල ගොඩ ගසා ඇත්තෙමුද, එවන් කුණු කසලවලින් අප හදවත පිරිසිදු කරගන්නා තෙක් අල්ලාහ් ගේ තෘප්තිය අපට නොලැබී යන්නේය.
" ගැත්තෙකු සිත යහපත් කර ගන්නා තුරු ඔහුගේ ඊමානය යහපත් නොවේ" (අහමද්)

### ඉහත කී තත්ත්වයන්ගේන් සිත ආරක්‍ෂා කර ගන්නේ කෙසේ ද?

අකුසල් අපගේ හදවත් වසා ගැනීමට පෙර අප ස්වයං ආරක්‍ෂාවක් සලසා ගත යුතුයි. අප හදවත හැකිතාක් දුරට ශක්තිමත්ව තබා ගත යුතුයි. ඒ සඳහා අප ප්‍රථමයෙන් ආරෝග්‍ය සම්පන්න වටපිටාවක් ගොඩ නගා ගත යුතුයි.

## අනිවාර්ය සලාතයන් අඛණ්ඩව ඉටුකිරීම

අපේ සලාතයන් නිසියාකාරව සාමුහිකව ඉටුකිරීමට අප වග බලාගත යුතුයි.

අල්ලාහ්ගේ සෙවනැල්ල හැර අන් සෙවනැල්ලක් දක්නට නැති එවන් දවසක කණ්ඩායම් හතකට අල්ලාහ් ඔහුගේ සෙවනැල්ල ලබා දෙයි. එයින් එක් කොටසක් වනුයේ, ඔවුන්ගේ හදවත් පිරී තිබුණේ පල්ලිය පිළිබඳ මතකයෙනි. පල්ලිය හැර යන විටදී, ඔවුන් නැවතත් පල්ලියට පිවිසීමේ ආශාවෙන් බලාපොරොත්තු වී සිටින්නේය. " මගේ දෑසේ සිසිලස සලාතය වේ. බිලාල් ! " සලාතයට කැඳවන්න. එයින් සැනසුම ලබා දෙන්න." (අල් හදීස්)

## නබි තුමාණන්ගේ සුන්නාව පිළිපැදීම

මුස්ලිම්වරයෙකු තම එදිනෙදා ජිවිතයේ සියලු කටයුතු නබි (සල්) තුමාණන් දේශනා කළ පරිදි සකසා ගත යුතුයි. අපට අල්ලාහ්ගෙන් ලැබෙන ආනිසංස ගැනද දැනුවත් විය යුතුයි. එය සඳහා අප ආශාවෙන් ක්‍රියා කල යුතුයි.
" ඔහු ඔබ අතරෙන් එක් දුතයෙකු මැව්වේය. ඔහු කෙසේද යත්, ඔහුගේ (අල්-ජුම්ආ : 2)

## දෙවියන් සිහිකිරීම (දික්කර්)

' දෙවියන්, නිතර සිහිකරන්නා ප්‍රාණය ඇත්තා සේය, සිහි නොකරන්නා අප්‍රාණිකයෙකු වේය."
(අල්-හදීස්)

"ඔබගේ ක්‍රියාවන්ගෙන් ඔබගේ පරමාධිපතියා වූ අල්ලාහ් ඉදිරියේ පාරිශුද්ධ ඔබගේ තත්ත්වයෙන් උසස් කොට දැක්වීමට හැකි වූත් රං, රිදී, කාසි අල්ලාහ්ගේ මාර්ගයේ දංදීමට වඩා අගනා වූත්, ශුද්ධ වූ යුද්ධයේදී ඔබ සතුරන් මරා දමනවාට වඩා හෝ සතුරාගෙන් මැරුම්කෑමට ලක්වනවාටත් වඩා ඉතාම ආනිසංස ගෙන දෙන ක්‍රියාවක් කියා දෙන්නද?" යැයි නබිවරයාණන් ඇසූ විට, සහබාවරුන් කියා දෙන්නැයි පැවුසුහ. එවිට නබි (සල්) තුමාණන් අල්ලාහ්ව දික්ර් කර මතක් කිරීම" යැයි කීහ.

## දුආ ප්‍රාර්ථනයෙහි යෙදීම

දුආ ප්‍රාර්ථනයෙහි යෙදීම ඉබාදතයෙකි. ඉතා බැගෑපත්ව ඉල්ලා සිටින දුආවන් අල්ලාහ් විසින් අනුමත කෙරේ.

"යම් කෙනෙකු තම දෑත් ඔසවා අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින විට එම දෑත් හිස්ව ආපසු හැරවීමට අල්ලාහ් ලැජ්ජා වෙයි"

(අල් හදීස්)

"රැයෙහි අවසාන භාගයෙහි එක් කොටසක අහස් තලයෙන් බිමට බැස එහි රැඳී සිට "මා ළඟ කව්රුන් ඉල්ලා සිටින්නේද, ඔවුන්ට මා පිළිතුරු දෙමි. යම් අවශ්‍යතාවයක් ඉල්ලා සිටින්නේ ද එය ඉටුකර දෙමි. පව්වලට සමාව අයදුනද ඔවුන්ට සමාව දෙමි." යැයි මගේ පරමාධිපති වූ අල්ලාහ් පවසන බව නබි (සල්) තුමාණන් ප්‍රකාශ කර සිටියහ.

(බුහාරි - මුස්ලිම්)

## ස්වයං පරීක්ෂණයට ලක් කිරීම (මුහාසබා)

"ඔබ පරීක්ෂණයට භාජනය වීමට පෙර ඔබම ඔබගෙන් ප්‍රශ්න කරගන්න ඔබගේ ක්‍රියාවන් කිරා බැලීමට පෙර ඔබම කිරා ඔබේ ක්‍රියාවන් කිරා බලන්න. අල්ලාහ්ව බැහැ දකින එම මහා දවසට සඳහා සූදා-නම්වෙන්න."

උමර් (රලි) තුමන්

## පව්වලට සමාව අයැදීම

"ආදම් (අලෛ) තුමාගේ පුතුනි! ඔබ මේ පොළොව තරම් විශාලත්වයෙන් පව් කරන ලදුව, මට ආදේශයන් නොකොට මා මුණගැසුනොත් මා එම විශාලත්වයෙන් වූ පව්වලට සමාව දෙමි."

(තිර්මිදි)

"පව් කිරීම නවතා යම් කෙනෙකු අල්ලාහ් වෙත නැඹුරුවීම උසස්ම ක්ෂමාව වන්නේය. යන්න කුර්ආනයේ දේශණාවයි."

## සුපරීක්ෂාකාරීව හැසිරීම

"අබූ හුරෙරා! සුපරීක්ෂාකාරීව සිටින්න. එවිට ඔබවේ, මිනිසුන්ගෙන් උසස් නැමදුම්කරුවා." (තිර්මිදි)

එසේ නම්, සිසුන් වන ඔබත් ඉහත සඳහන් සියල්ල රකිමින් සිත පාරිශුද්ධ කොට ගෙන හොඳින් ඉගෙන ගෙන අල්ලාහ්ගේ දයාව ලබා ගන්න.

**පැවරුම**

**මානසික සුවයෙන් සිටින්නේ කෙසේද යැයි ශිෂ්‍ය සභාවක කථාවක් පවත්වන්න.**